# ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ගැන ඔබට යමක්

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය කෙසේ, කුමක් අරභයා පිහිටුවා තිබේද ?**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරිමේ පනතට අනුව 2001 මාර්තු මස 01 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරිම, අධීක්ෂණය කිරිම සහ විධිමත් කිරිම සඳහා මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද රජයට අනුබද්ධ ආයතනයකි.

කෘෂිකාර්මික සහ ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව හා ජාතික රක්ෂණ භාර අරමුදල සම්බන්ධයෙන් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරිමේ පනතේ විධිවිධාන වලට ඇතුලත් නොවන හෙයින් එම ආයතන රක්ෂණ මණ්ඩලයේ පාලනය යටතට නොවැටේ.

**රක්ෂණ කර්මාන්තය තුළ රජයේ මැදිහත්වීම කුමක්ද ?**

වෙනත් ඕනෑම වාණිජ සේවාවක් පිළිබඳව මෙන්ම රක්ෂණ සේවාවන් පිළිබඳව ද මහජන අවධානය සහ අවබෝධය වැඩෙමින් පවතී. එසේම පොදුවේ පාරිභෝගිකයින් තම අයිතිවාසිකම් ගැන වඩාත් දැනුවත් කමක් ලබමින් සිටින අතර අවස්ථානුකූලව තම අයිතීන් පිළිබඳව කටයුතු කිරිමට උත්සුක වෙති.

ශ්‍රී ලංකාවේදී මෑත කාලයේදී සිදු නොවුවද ලොව වෙනත් බොහෝ රටවල රක්ෂණ සමාගම් වස්තු භංගත්වයට පත්වූ බවට වාර්තා වී ඇත. විනිවිදභාවය සම්බන්ධ කරුණු මුල් කොටගෙන රක්ෂණ සමාගම්වල කටයුතු නිතර විවේචනයට භාජනය වන අතර නිතර අසන්නට ලැබෙන විවේචන අතරින් හිමිකම් නොගෙවීම්, හිමිකම් ගෙවීමට ප්‍රමාද වීම්, හිමිකම් ගෙවීමේ අසාධාරණ කම්, රක්ෂණ සැලසුම් පිළිබඳ නිවැරදි තොරතුරු පාරිභෝගික ජනතාවට හෙළි නොකිරිම, වෘත්තීය වේදිත්වයක් නොමැතිවීම, ආදිය ප්‍රධාන කරුණු වේ. කරුණු මෙසේ හෙයින් රක්ෂණ කර්මාන්තය තුළ සමානාත්මතාවය සහ සාධාරණත්වය සුරැකීම සඳහා රජය විසින් වර්ෂ 2001 දී ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ පාලනාධිකාරිය ලෙස ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ආරම්භ කරන ලදි.

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අරමුණ හා වගකීම කුමක්ද ?**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන අරමුණ හා වගකීම වන්නේ වර්තමාන හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා වන පරිදි ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන රක්ෂණ කටයුතු අවංකභාවයෙනුත්, වෘත්තීය මට්ටමිනුත් හා ඥානාන්විත ආකාරයටත් සිදු කෙරෙන බව සහතික කිරිමයි.

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ බලතල හා කාර්යයන්**

1. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ කටයුතු කිරිමට හැකි වන පරිදි ඒ සඳහා කැමැත්ත දක්වන, පනතට අනුකූලව සුදුසුකම් සපුරන සමාගම් රක්ෂණ කරුවන් (රක්ෂණ සමාගම්) වශයෙන් ලියාපදිංචි කිරිම. මේ අනුව දැනට සමාගම් 19ක් ලියාපදිංචි කර තිබේ.

2. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ තැරැව්කාර කටයුතු වල නියැලීම සඳහා පනතට අනුකූලව සුදුසුකම් සපුරන සමාගම් රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරිම. තැරැව්කාර සමාගම් 41ක් දැනට මණ්ඩලය යටතේ ලියාපදිංචි කොට ඇත.

3. යම් පුද්ගලයෙකු රක්ෂණ සමාගමක් මගින් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් මගින් රක්ෂණ නියෝජිතයෙකු ලෙස පත්කරනු ලැබීම සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් නියම කිරිම.

4. රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම

5. රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

6. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු ක්‍රියා සිදු කිරීම.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් මොනවාද ?

1. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන රෙගුලාසි, නියෝග හා රීති සකස් කිරීම.

2. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් වශයෙන් ලියාපදිංචි වීම සඳහා කැමැත්ත දක්වන සමාගම් මගින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් කටයුතු කොට ඒවා නිර්දේශ කිරීම.

3. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය කෙරෙහි බලපාන නීති හා රෙගුලාසි නිසි පරිදි අනුගමණය කරන්නේද යන්න අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳ විමර්ශනය කිරීම.

4. රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් සම්බන්ධයෙන් අදාල රක්ෂණ නීති රීති, රෙගුලාසි හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් ඔවුන් විසින් පිළිපදින්නේද යන්න ස්ථානීය හා ස්ථානීය නොවන පරීක්ෂණ මගින් සහතික කිරීම. රක්ෂණ සමාගම්වල මූල්‍ය වාර්තා පිරික්සා ඒවා විධිමත්ව පවත්වාගෙන යන බවට වගබලා ගැනීමද මීට ඇතුලත් වේ.

5. මහජනතාව, ශිෂ්‍යයින්, ව්‍යාපාරිකයින් හා රක්ෂණ කර්මාන්තයේ නියැලි නිලධාරින් උදෙසා තොරතුරු ලබාදීම සහ විවිධ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා දේශන සිදු කෙරෙන අතර මණ්ඩලය විසින් රක්ෂණ විෂය පිළිබඳව සකසන ලද විවිධ පත්‍රිකා හා පොත්පත් ද නිකුත් කරනු ලැබේ. මීට අමතරව විශේෂ කරුණු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් නිරතුරුව දැනුම්දීම් සිදු කරනු ලැබේ.

6. රක්ෂණ සමාගම්වලට එරෙහිව රක්ෂණ ඔප්පුහිමියන් විසින් කරනු ලබන රක්ෂණ හිමිකම් නොගෙවීම් සහ අනෙකුත් ගැටළු සම්බන්ධ පැමිණිලි ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් විභාග කරනු ලබයි. එම පැමිණිලි සමථයකට පත් කිරීම තුළින් රක්ෂණ කර්මාන්තය තුළ සමානාත්මතාවය හා සාධාරණත්වය සුරැකීම සහතික කෙරේ.

රජයට අයත් නොවන ව්‍යාපාරික ආයතනවල කටයුතු අවම ලෙස රජයේ පාලන රෙගුලාසි වලට යටත්ව ස්වයං පාලනයකින් සිදුවීම නිදහස් වෙළඳපොල සංකල්පය තුල බලාපොරොත්තු වේ. මේ සඳහා තම ව්‍යාපාරික කටයුතු, පිළිගත් අචාර ධර්ම  වලට අනුව පවත්වාගෙන යෑම පිළිබඳව  නොයෙකුත් එකඟතාවයන්ට එළඹීම අත්‍යාවශ්‍ය වේ. ස්වයංපාලනයක් සහිත ආචාරශීලි රක්ෂණ වෙළඳපොලක් වෙත රක්ෂණ සමාගම් හා රක්ෂණ නියෝජිතයන් යොමුකිරීම සඳහා ශ්‍රී ලංකාවේ සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය නිරතුරු සබඳතාවයන් පවත්වාගෙන සිටී.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
දුරකථනය : 011 2396 184-9